# සාර්ථක පවුල් ජීවිතයකට බුදුදහමේ මගපෙන්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ හිටපු කථිකාචාර්ය, කිස්බරෝ ධම්ම සරණ විශාරවාදී
දඹුල්ලේ සුදේව හිමි
(BA, MA, Royal Pandit, Dip. in Buddhist Counselling Psychology)

බුදුසමය ප්‍රධාන වශයෙන්ම සංසාර විමුක්තිය අරමුණු කරගත් දර්ශනයක් වුව ද එදිනෙදා ජීවිතය සාර්ථක කරගැනීම සඳහා උපකාරී වන ඉගැන්වීම්වලින් ද අනූන වේ. සමාජීය යහපැත්වම උදෙසා වූ ඉගැන්වීම් රැසක් විශේෂයෙන්ම බෞද්ධ සූත්‍ර සාහිත්‍ය යේදී අපට හමුවේ. මෙම ලිපියේදී විශේෂයෙන්ම බලාපොරොත්තු වන්නේ යහපත් පවුල් ජීවිතයක් ගතකිරීම සඳහා බුදුසමයේ එන ඉගැන්වීම් උපයෝගී කොටගත හැකි ආකාරය පිළිබඳව සාකච්ඡා කිරීමටයි. පවුල් සංස්ථාවක් ආරම්භ වන්නේ විවාහයකිනි. කායික හා මානසික වශයෙන්ද නෛතික වශයෙන්ද ස්ත්‍රී  පුරුෂ යුවළක් අතර ඇති කර ගන්නා අවියෝජනීය සම්බන්ධතාව යුග ජීවිතය වශයෙන් සරලව අර්ථ දැක්විය හැකිය.

යුග දිවියට පිවිසීම අර්ථවත් කිරීම සඳහා ‘දීග යෑම’ යන ව්‍යවහාරයක් සිංහල භාෂාවේ භාවිත වේ. දීර්ඝ කාලයක් විසීම පිණිස යන ගමනක් හෙයින් එය මෙලෙස හැඳින්වේ. එය ගැහැනියකගේ හා පිරිමියෙකුගේ දෙවන උත්පත්තිය වශයෙන්ද සැලකිය හැකිය.

එහෙත් අවාසනාවකට මෙන් නූතනයේ බොහෝ පවුල් ජීවිත දෙදරා යාම් අසන්නට ලැබේ. මෙය සමාජ ප්‍රශ්නයක් වන තරමටම වර්ධනය වීම විශේෂයෙන්ම අවධානයට ලක්විය යුත්තකි. අඹුසැමියන් අතර අන්‍යෝන්‍ය අවබෝධය නොමැති වීම, සිය යුතුකම් පිළිබඳව සැලකිලිමත් නොවීම, කැපකිරීම් නොකිරීම, ආර්ථික ප්‍රශ්න ආදිය මේ සඳහා හේතු වන බව දැක ගත හැකිය. යහපත් පවුල් ජීවිතයක් ගතකිරීම උදෙසා බුදුසමයේ එන ඉගැන්වීම් භාවිත කළ හැකි ආකාරය පිළිබඳව සාකච්ඡා කිරීමේදී ප්‍රධාන වශයෙන් සිඟාලෝවාද සූත්‍රය (දීඝ නිකාය), සක්කනමස්සන සූත්‍රය (සංයුත්ත නිකාය), පඨම සංවාස සූත්‍රය (අංගුත්තර නිකාය), දුතිය සංවාස සූත්‍රය (අංගුත්තර නිකාය), නකුලපිතු සූත්‍රය (අංගුත්තර නිකාය), සත්ත භරියා සූත්‍රය (අංගුත්තර නිකාය), උග්ගහ සූත්‍රය (අංගුත්තර නිකාය)
වැනි සූත්‍ර ධර්ම ඉතා වැදගත් වේ.

## විවාහය හා පවුල

පවුල සමාජයේ කුඩාම ඒකකය බව ප්‍රසිද්ධ කරුණකි. පවුලක් ආරම්භ වීමේ මූලික පියවර වන්නේ විවාහයයි. සමාජ විද්‍යාවට අනුව දරුවන් ලැබීමත්, ලිංගික වශයෙන් ස්වාමියා හා බිරිඳ පිළිගත් සමාජ රාමුවක් යටතේ සංතෘප්ත වීමත්, ආර්ථික සහයෝගීතාව පවත්වාගැනීමත්, හුදකලා බවින් තොරව සංකීර්ණ ඥාති සම්බන්ධතා ආදිය පවත්වා ගැනීමත් විවාහයේ අපේක්ෂාවන් වේ. රැකවරණය, සමාජානුයෝජනය, ලිංගික චර්යාවන් පාලනය, සෙනෙහස හා මිත්‍රශීලීත්වය පාලනය ආදිය විවාහයෙන් අපේක්ෂිත සමාජ කෘත්‍යයන් අතර ප්‍රධාන වේ.

විවාහය මුල් කොටගෙන ගොඩ නැගෙන පවුල නම් වූ සමාජ ඒකකය පිළිබඳව ද මෙහි ලා මදක් විමසා බැලිය යුතුය. ‘පවුල’ යන්නට සමානාර්ථවත් පද ලෙස කුලය, පෙළපත, වංශය, කුල පරපුර, ගෝත්‍රය, කුටුම්බය වැනි වචන යෙදුණු තැන් රැසක් සාහිත්‍යයෙහි හා සමාජ ව්‍යවහාරයෙහි හමුවේ. යහපත් පවුල් පරිසරයක් සමස්ත සමාජයේම යහපැවැත්ම උදෙසා විශාල බලපෑමක් කරන බව පැහැදිලිය. මන්ද යත් මානව පෝතකයන් මුලින්ම සමාජානුයෝජනය වන්නේ පවුල ආශ්‍රයෙන් නිසාවෙනි. එම කාර්යය මනාව සිදු නොවුණහොත් මුලුමහත් සමාජයටම පිළිළයක් වන පිරිසක් බිහිවීමට බොහෝ දුරට ඉඩ ප්‍රස්තාව ඇත.

## බෞද්ධ විවාහ උපදේශනය

ප්‍රජා උපදේශන ක්‍රියාවලියේ ප්‍රබල අංගයක් ලෙස පවුල් උපදේශනය හැඳින්විය හැකිය. කිසියම් පවුලක් තම පවුලේ සමතුලිතතාවයට බලපාන කිසියම් ගැටලුවක් ඇතිව උදව් ඉල්ලා පැමිණි විට ඔවුන්ට කරන උපදේශනය පවුල් උපදේශයයි.

## අන්‍යෝන්‍ය යුතුකම් ඉටුකිරීම

මේ අයිතිවාසිකම් ඉල්ලා අරගල කරන යුගයකි. බුදුසමය අයිතිවාසිකම් පිළිබඳව අවධාරණය නොකරන අතර සෑම පුද්ගලයෙකුම සිය යුතුකම් මනාව ඉටු කළ යුතු බවත් ඒ තුළින් සහපත් සමාජයක් ගොඩනැගිය හැකි බවත් පෙන්වා දේ. මෙහිලා දීඝනිකායේ එන සිඟාලෝවාද සූත්‍රයට ලැබෙන්නේ ප්‍රමුඛස්ථානයකි. මෙහි ඉගැන්වෙන පරිදි සැමියාගෙන් බිරිඳට පහත දැක්වෙන යුතුකම් පහ ඉටුවිය යුතුය.

1. බිරිඳට ගරු කිරීම
2. අවමන් නොකිරීම
3. පර අඹුවන් වෙත නොයෑම
4. නිවසේ කටයුතු  පවරා දීම
5. වස්ත්‍ර ආභරණ ආදිය දී සැලකීම

මෙම කරුණු පහට අමතරව යහපත් ස්වාමියෙකු වීම සඳහා අනුගමනය කළ හැකි ඉගැනිවීම් රැසක් සූත්‍ර පිටකයේ පළින් පළ හමුවේ. සංයුත්ත  නිකායේ සක්ක සංයුත්තයේ සක්ක නමස්සන සූත්‍රයේ සඳහන් වන පරිදි මනුෂ්‍ය ලෝකය දෙසට නමස්කාර කරමින් සිටි ශක්‍රයාගෙන් ‘කවරෙකුට නමස්කාර කරන්නේ දැයි’ ඇසූ මාතලී දිව්‍ය පුත්‍රයාට සක්‍ර දේවේන්ද්‍රයා මෙසේ පිළිතුරු දෙයි.

“යේ ගහට්ඨා පුඤ්ඤකරා සීලවන්තෝ උපාසකා,

ධම්මේන දාරං පෝසෙන්ති තේ නමස්සාමි මාතලී”

(පිං දහම් කරන, සිල්වත් වූ ගිහි ජීවිත ගත කරන,  දැහැමින් අඹු දරුවන් පෝෂණය කරන, උපාසකයන්ට මම නමස්කාර කරමි.)

මේ අනුව පැහැදිලි වන්නේ ධාර්මිකව අඹුදරුවන් පෝෂණය කරමින් යහපත් දැහැමි ජීවිත ගතකරන පුද්ගලයන්ට දෙවියන්ට අධිපති වූ ශක්‍රයා පවා නමස්කාර කරන බවයි. යහපත් ලෙස පවුල ආරක්ෂා කිරීමට කොතරම් වැදගත් කමක් බුදුසමය තුළ ලබා දී තිබේද යන්න මේ අනුව මොනවට පැහැදිලිවේ.

පරාභව සූත්‍රයේදී ස්වකීය බිරිඳගෙන් සංතෘප්ත නොවී වෙසඟනන් වෙත යන පුද්ගලයන් පිරිහීමට පත්වන බව දැක්වේ.
සේහි දාරේහි සන්තුට්ඨෝ
වේසියාසූපදිස්සති

දිස්සති පරදාරේසු  තං පරාභවතෝ මුඛං
එමෙන් ම මහාමංගල සූත්‍රයේදී ‘පුත්තදාරස්ස සංගහෝ ඒතං මංගලමුත්තමං’ යැයි දැක් වූ පරිදි අඹුදරුවන් පෝෂණය කිරීම මංගල හෙවත් යහපත් කරුණකි. සිඟාලෝවාද සූත්‍රය දක්වන පරිදි බිරිඳගෙන් සැමියාට පහත දැක්වෙන යුතුකම් ඉටුවිය යුතුය.

1. උපයන දේ රැකගැනීම
2. අලස නොවී වැඩ කිරීම
3. නිවසේ කටයුතු සොයා බැලීම
4. සැමියාගේ පිරිවර ජනයාට හොඳින් සැලකීම
5. සොර සැමියන් නොපැතීම

මෙකී කරුණු පහට අමතරව යහපත් බිරිඳක් වීම සඳහා අනුගමනය කළ හැකි ඉගැන්වීම් රැසක් ද සූත්‍ර සාහිත්‍යයේ තැනින් තැන හමුවේ. විවාහ වී සැමියා සමග නික්ම යාමට පෙර විශාකා උපාසිකාවගේ පියා ඇයට දුන් අවවාද දහය මෙහිලා ඉතා වැදගත් වේ. එම උපදෙස් දහය මෙසේය.

1. ඇතුළත ගිනි පිටතට නොදෙන්න
2. පිටත ගිනි ඇතුළට නොගන්න
3. දෙන්නන්ටම දෙන්න
4. නොදෙන්නන්ට නොදෙන්න
5. දෙන්නන්ටත් නොදෙන්නන්ටත් දෙන්න
6. සුදුසු අසුනක වාඩිවෙන්න
7. සුවසේ ආහාර ගන්න
8. සුවසේ නිදන්න
9. ස්වාමියාට සහාය වන්න
10. ස්වාමියාගේ දෙමව්පියන්ට සලකන්න

අංගුත්තර නිකායේ උග්ගහ සූත්‍රයේදී විවාහපත්වීමට සූදානම්ව සිටින දියණියකට පියාගේ ආරාධනය පරදි බුදුහිමියෝ මෙසේ උපදෙස් දෙති.

- ස්වාමියාට පළමුව පිබිදීම, ස්වාමියාට පසු නින්දට යාම, කළ යුතු දේ සොයා බලා කිරීම, මන වඩන ලෙසන් හැසිරීම, ප්‍රිය වචන කතා කිරීම
- මාපියන්ට, නැදි මයිලනුවන්ට, ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට ගරු කිරීම
- ස්වාමියාගේ කටයුතු අනලස්ව ඉටු කිරීම
- මෙහෙකරුවන්ට සලකමින් ඔවුන් නිසි කටයුතු සඳහා මෙහෙයවීම හා කළ නොකළ වැඩ පිළිබඳ අවබෝධයක් ලබාගැනීම
- නිවසේ සිටින ගිලන් අයට උපස්ථාන කිරීම හා අවශ්‍ය කළමනා සම්පාදනය කිරීම

අංගුත්තර නිකායේ සත්තක නිපාතයේ සත්තභරියා සූත්‍රයේදී භාර්යාවරුන් සත් දෙනෙකු පිළිබඳ කියවේ.
‘‘සතත බො ඉමා සුජාතෙ පුරිසසස භරියායො කතමා සතත? වධක සමා, චොරි සමා, අය්‍ය සමා, මාතු සමා, භගිනි සමා, සඛී සමා, දාසි සමා, ඉමා බො සුජාතෙ සතත පුරිසසස භරියායො ’’

මෙම සප්තභාර්යාවරුන්ගෙන් යහපත් භාර්යාවරු සිව්දෙනෙකි. ඔවුහු ස්වාමියාගේ යහපත කැමති වෙති; ජීවිතයේ මූලික අරමුණු දැන නිසි අවබෝධයෙන් කටයුතු කරති. ඒ,

1. **මාතු සම** ස්වාමියා කෙරෙහි මවක මෙන් පවතින බිරිඳ
2. **භගිනි සම** ස්වාමියා කෙරෙහි සොහොයුරියක මෙන් පවතින බිරිඳ
3. **සඛී සම** ස්වාමියා කෙරෙහි යෙහෙළියක මෙන් පවතින බිරිඳ
4. **දාසි සම** ස්වාමියා කෙරෙහි දාසියක මෙන් පවතින බිරිඳ

යනුවෙනි. මෙම සූත්‍රයට අනුව අයහපත් භාර්යාවෝ තිදෙනෙක් වෙති.

1. **වධක සම** වධකාරියක මෙන් ස්වාමියාට කරදර ගෙනදෙන බිරිඳ
2. **චෝරි සම** සෙරක මෙන් කටයුතු කරන බිරිඳ
3. **අය්‍ය සම** ස්වාමියෙකු මෙන් පැවතුම් ඇති බිරිඳ

වධක සම භාර්යාව ස්වාමියාට කරදර උපදවන, සිත් පීඩා ඇති කරන අයුරින් කටයුතු කරන්නීය; ස්වාමියා කෙරෙහි හිතානුකම්පී අදහස් නොමැති අතර පර පුරුෂයන් කෙරෙහි ඇලුණු සිතැත්තී සැමියා ඉක්මවා යයි. යම් භාර්යාවක් වෙළඳාම, ගොවිකම යනාදි ක්‍රම මඟින්  ස්වාමියා උපයන ධනය හා වෙනත් උපභෝග වස්තූන් අල්පයකුදු සොරකම් කිරීමටත් ගුප්ත හා ප්‍රයෝගකාරී ලෙස ජීවත් වෙමින් ස්වාමියාගේ විශ්වාසය සොරකම් කිරීමටත් යුහුසුලු වේද ඒ චෝරි සම භාර්යාවගේ ලක්ෂණයයි. අය්‍ය සම භාර්යාව ස්වාමියාගේ ප්‍රතිරූපයට ඉහළින් කටයුතු කරන්නීය; සේව

34 වන පිටට